# 留学生から見た和歌山の魅力

ABEYKOON MUDIYANSELAGE PIYUMI NADEESHA ABEYKOON
日本語・日本文化研修留学生　スリランカ



ある場所の魅力というと、ほとんどの人は自然の価値を思い浮かべがちですが、私にとって魅力とは、自然だけでなく歴史や文化などさまざまな分野での価値を意味する。

和歌山県は、日本の美しい自然と豊かな文化が融合した魅力的な地域だ。留学生として日本へ来てから和歌山でたくさんのことを体験できた。和歌山は、山とか川とか海がある自然の豊かなところで、天気もとてもいいところだ。スリランカには季節がないので、初めて和歌山で四季を体験した。とても素晴らしかった。また、私はアルバイトをやっているところも眺めがよく、そこから和歌山城も見える。そこから四季折々の和歌山城の素晴らしさが見られた。和歌山城は地域のシンボルであり、城内を散策すると戦国時代や江戸時代の歴史について知ることができる。

和歌山は自然だけではなく歴史的に見てもたくさんの世界遺産がある。熊野古道と高野山は一番有名な世界遺産だ。日本の一番長い滝は、和歌山県にある那智の滝だ。私は和歌山でたくさんのところを旅行した。高野山、熊野古道、那智の滝、那智大社、和歌浦、磯ノ浦、紀三井寺、橋杭岩、南部、田辺、加太など、いろいろなところに行った。夏休みは白浜に行くつもりだ。紀三井寺や根来寺などの寺院も深い歴史と美しい建築を誇り、日本の宗教文化を体感できるところだ。地元の祭りや伝統行事も和歌山の文化を学ぶ良い機会だと思う。例えば、那智の火祭りは、壮大な火のパフォーマンスとともに古代の信仰を感じることができる素晴らしいイベントだ。また、和歌浦の和歌祭りも和歌山の歴史的な価値がある祭りだ。私も今年和歌祭りに参加した。



和歌山は、新鮮な魚介類や特産品が豊富な県で、特に白浜周辺では新鮮な魚介類を味わうことができる。和歌山ラーメンや梅干しやめはり寿司やグリーンソフトも有名で、一度食べたら忘れられない独特の味わいだ。私は梅で使ったいろんな飲み物が大好きだ。そして、和歌山県は今でも高級フルーツの生産量日本一だ。だから、和歌山は、「果樹王国和歌山」と呼ばれている。和歌山で一番有名な果物はみかんだ。そして、もも、いちご、かき、ブルーベリーなども有名だ。

留学生として和歌山で生活する中で、地元の人々の温かさも大きな魅力だと感じた。みんなとても親切だ。いろいろな交流イベントに参加した時、みんなが留学生の私たちに和歌山の文化、祭り、歌、文学などについて教えてくれた。

このように、和歌山は自然美、歴史文化、食文化、そして人々の温かさと、様々な魅力に溢れた地域だ。留学生としてここで過ごした時間は、私にとって貴重な経験となった。私は和歌山に来てから、静けさと自然が大好きになった。なぜかと言うと私はスリランカの都会に住んでいたため、自然の美しさや街の静けさの良さを知らなかったからだ。私の人生で一番幸せな時期は、留学生として和歌山に住んでいた一年間だ。この素晴らしい地域での体験を通じて、日本の魅力を再発見することができた。和歌山は、これからも多くの留学生に愛され続けることだろう。



# ජාත්‍යන්තර සිසුවෙකු ලෙස දුටු වකයමහි චමත්කාරය

ABEYKOON MUDIYANSELAGE PIYUMI NADEESHA ABEYKOON

**ශ්‍රී ලංකාව**

බොහෝ අය යම් ස්ථානයක ආකර්ශනීය බව ගැන සිතන විට ඔවුන් ස්වභාවධර්මයේ වටිනාකම ගැන සිතීමට නැඹුරු වනමුත් මට නම් ආකර්ෂණය යනු ස්වභාවික වටිනාකම පමණක් නොව ඉතිහාසය, සංස්කෘතිය වැනි විවිධ ක්ෂේත්‍රවල වටිනාකමයි.

වකයම ප්‍රාන්තය යනු ජපානයේ සුන්දර ස්වභාවය සහ පොහොසත් සංස්කෘතියක් ඇති ආකර්ශනීය ප්‍රදේශයකි. ජාත්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස, මට වකයාමාහි බොහෝ දේ අත්විදීමට හැකි විය. වකයම කඳු, ගංගා සහ මුහුද සහිත ස්වභාවිකව පොහොසත් ස්ථානයක් වන අතර කාලගුණය ද ඉතා යහපත් වේ. ලංකාවේ ඍතු නැති නිසා මම පළමු වතාවට වකයාමහිදී ඍතු හතර අත්වින්දෙමි. ඒක හරිම අපූරුයි. ඒ වගේම මම අර්ධකාලීනව රැකියාව කරන ස්ථානයේ සිට ලස්සන දර්ශනයක් පෙනේ. මට එතන ඉඳන් වකයම මාලිගාව පෙනේ. එතන සිට මට ඍතු හතරේදිම වකායම මාලිගාවේ අසිරිය දැකගත හැකි විය. වකයම මාලිගාව යනු ප්‍රාදේශීය සංකේතයක් වන අතර එහි බලකොටුව වටා ගමන් කරන විට අපට යුධ සමයේ සහ එදෝ යුගයේ ඉතිහාසය පිළිබඳ දැනගත හැකිය.

වකයම යනු ස්වභාවික පමණක් නොව ඓතිහාසිකව බොහෝ ලෝක උරුම ස්ථාන රැසක් තිබෙන ප්‍රදේශයකි. කුමනොකොදෝ සහ කෝයා කන්ද වඩාත් ප්‍රසිද්ධ ලෝක උරුම ස්ථාන වේ. ජපානයේ දිගම දියඇල්ල වන්නේ වකයමහි පිහිටා ඇති නචි ඇල්ලයි. මම වකායම ප්‍රදේශයේ බොහෝ ස්ථානවල සංචාරය කර තිබේ. මම කෝයා කන්ද, කුමනොකොදෝ, නචි ඇල්ල, නචි තායිෂා, වකඋර, ඉසොනෝරා, කිමිදෙරා, හෂිකු පර්වතය, මිනබේ සහ තනබේ, කදා වැනි විවිධ ස්ථානවලට ගොස් ඇත. මම ගිම්හාන නිවාඩු කාලය තුළ ශිරහම වෙත යාමට සැලසුම් කරගෙන සිටිමි. කිමිදෙරා සහ නෙගොරෝජි වැනි විහාරස්ථාන ගැඹුරු ඉතිහාසයක් සහ අලංකාර ගෘහ නිර්මාණ ශිල්පයන් ගැන විදහා දක්වන අතර ජපානයේ ආගමික සංස්කෘතිය අත්විදීමට ඉඩ සලසයි. දේශීය උත්සව සහ සාම්ප්‍රදායික උත්සව ද වකයමහි සංස්කෘතිය ගැන ඉගෙන ගැනීමට හොඳ අවස්ථා යැයි මම සිතමි. නිදසුනක් වශයෙන් නචි ගිනි උත්සවය යනු දර්ශනීය ගිනි සංදර්ශන සමඟ පුරාණ විශ්වාසයන් අත්විදිය හැකි අපූරු උත්සවයකි. වකඋරහි වකමත්සුරි උත්සවය ද වකයමහි ඓතිහාසික වටිනාකමක් ඇති උත්සවයකි. මා ද මේ වසරේ වකමත්සුරි උත්සවයට සහභාගී විය.

නැවුම් මුහුදු ආහාර සහ විශේෂිත නිෂ්පාදන වලින් පොහොසත් වන ප්‍රාන්තයක් වන අතර විශේෂයෙන් ශිරහමා අවට නැවුම් මුහුදු ආහාර රස විඳිය හැකිය. වකයම රාමන්, උමෙ, මෙහරි සුෂි, අයිස් ක්‍රීම් ප්‍රසිද්ධ වන අතර, එක් වරක් කෑ පසු ඒවායේ අද්විතීය රසය අමතක නොවේ. මමත් උමෙ වලින් සාදන ලද සියලුම බීම වර්ග වලට ගොඩක් කැමතියි. එමෙන්ම වකයම ප්‍රාන්තය තවමත් ජපානයේ උසස් තත්ත්වයේ පලතුරු නිපදවන අංක එකේ නිෂ්පාදකයා වේ. ඒ නිසා වකයම ''පළතුරු රාජධානිය'' ලෙස හඳුන්වයි. වකයමහි වඩාත් ප්‍රසිද්ධ පලතුර වන්නේ මැන්ඩරින් දොඩම් ය. තවද, පීච්, ස්ට්‍රෝබෙරි, කකි සහ බ්ලූබෙරි සඳහා ද ප්‍රසිද්ධය.

ජාත්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස වකයම ප්‍රදේශයේ ජීවත් වන විට, දේශීය ජනතාවගේ උණුසුම පිළිගැනීමක් ඇති බව මට දැනුනි. හැමෝම ඉතා කරුණාවන්ත වේ. අපි විවිධ වැඩසටහන්වලට සහභාගී වූ විට සියලුදෙනා අපට වකයමහි සංස්කෘතිය, උත්සව, ගීත, සාහිත්‍යය යනාදිය පිළිබඳ ඉගැන්වූහ.

ඉහත සඳහන් කළ පරිදි වකයම යනු ස්වභාවික සුන්දරත්වය, ඓතිහාසික සංස්කෘතිය, ආහාර සංස්කෘතිය සහ එහි ජනතාවගේ උණුසුම ඇතුළු විවිධ දේවලින් ආකර්ශනීය වූ ප්‍රදේශයකි. ජාත්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස මම මෙහි ගත කළ කාලය මට වටිනා අත්දැකීමක් විය. මම වකයම ආ පසු නිහඬතාවයට හා සොබාදහමට ආදරය කළෙමි. හේතුව මම ලංකාවේ නගරබද ප්‍රදේශයක ජීවත් වීමයි. මම වකයම ප්‍රදේශයේ ජීවත් වෙමින් අධ්‍යාපනය ලබූ මේ අවුරුද්ද මගේ ජීවිතේ වඩාත්ම සතුටුම කාලය වේ. මෙම අපූරු ප්‍රදේශයේ ජීවත් වීමෙන් ජපානයේ චමත්කාරය සොයා ගැනීමට මට හැකි විය. වකයමවට බොහෝ ජාත්‍යන්තර සිසුන් විසින් දිගටම ආදරය කරනු ඇත.